# මහජනතාව වෙත කරනු ලබන නිවේදනයයි

**ශ්‍රී ලංකා මහ බැංකුව**
**இலங்கை மத்திய வங்கி**
**CENTRAL BANK OF SRI LANKA**

# අනවසර මුදල් ව්‍යාපාර සහ තැන්පතු රැස්කිරීම

## අතපත්තු මුදියන්සේලාගේ දම්මික කුමාර අතපත්තු සහ ඉයෝන් ලංකා ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිල්ම් ප්‍රඩක්ෂන් ඉන්ටර්නැෂනල් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් (පීවී 125740)

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 42 වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉහත දැක්වෙන ආයතනය පිළිබඳ විමර්ශනයක් සිදු කරන ලදී. එකී විමර්ශනයෙහි ප්‍රතිඵල අනුව 2020.09.15 දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේදී **"සමන් කැකුල", ඇඹලව, දෙමටළුව කුරුණෑගල** පදිංචි/ පිහිටා ඇති අතපත්තු මුදියන්සේලාගේ දම්මික කුමාර අතපත්තු මහතා සහ ඉයෝන් ලංකා ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆිල්ම් ප්‍රඩක්ෂන් ඉන්ටර්නැෂනල් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ් සමාගම විසින් නීති විරෝධී මුදල් ව්‍යාපාරයක යෙදී සිටි බව නිගමනය කරන ලදී. එම ව්‍යාපාරයෙහි මුදල් තැන්පත් කළ අයගේ සමස්ත තැන්පතු ආපසු ගෙවීම සඳහා කාල රාමුවක් සහිත සැලැස්මක් ඉදිරිපත් කරන ලෙස එකී සමාගමට විධානය කරන ලදී. එලෙස ඉදිරිපත් කළ සැලසුම පිළිගත නොහැකි බව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය 2020.10.21 දින පැවති රැස්වීමේදී තීරණය කර ඇත. තවද, මුදල් මණ්ඩලයේ උපදෙස් මත මෙම නීති විරෝධී තැන්පතු ලබා ගැනීම සම්බන්ධයෙන් මුදල් ව්‍යාපාර පනතෙහි ප්‍රතිපාදන යටතේ අපරාධ නඩු පැවරීම සඳහා ඉල්ලීමක් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නීතිපති දෙපාර්තමේන්තුව වෙත 2020.11.02 දින වාර්තාවක් යවා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව මේ වන විටත් ඉහතින් සඳහන් කරන ලද පුද්ගලයාට සහ සමාගමට පහත දැක්වෙන කාරණා තහනම් කරන නියෝග නිකුත් කොට ඇත: කිසිදු ආකාරයකින් තැන්පතු භාර ගැනීම හෝ වෙනත් අරමුදල් රැස් කිරීම; වත්කම් හැරලීම/ අන්සතු කිරීම; යම් ගිණුමකට දේපළකට හෝ ආයෝජනයකට සම්බන්ධ ගනුදෙනුවකට ඇතුළුවීම. එවැනි කටයුතු ක්‍රියාවිරහිත කරමින් නිකුත් කරනු ලැබූ තහනම් නියෝගය කොළඹ මහාධිකරණය විසින් 2021.01.15 දින දක්වා දීර්ඝ කරන ලදී.

**අධ්‍යක්ෂ**
**බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**

**ශ්‍රී ලංකා මහ බැංකුව, අංක 30, ජනාධිපති මාවත, කොළඹ 01**

☎ 0112477000, 0112440330, 0112330220 @ dsnbfi@cbsl.lk http://www.cbsl.gov.lk